"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone 011-2093000

මගේ අංකය. / எனது இல. / My No. CSWP/ADM/18-38/FI/01-2019 | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2019-02-01

**පළාත් චක්‍රලේඛ : 05/2019**

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
සභා ලේකම්(බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව-බ.ප.),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ නොකිරීම මත වැටුප් වර්ධක විලම්භනය කිරීම සම්බන්ධවයි.</u>**

2013.04.02 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවට අනුව බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්, එම ශ්‍රේණියට පත්වූ දින සිට වසර 05 ඇතුළත යෝජිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. ඒ අනුව නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියට 2013.04.02 දින හෝ එදිනෙන් පසු උසස්වීම් ලද නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට නියමිත වසර 05ක කාලය 2018.04.01 දිනෙන් පසු අවසන් වන අතර ඒ වන විට අදාල කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කෙට නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පහත පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/APP/4/62/2018 හා 2018.07.23 දිනැති ලිපියෙන් දන්වා ඇති බව 2018.08.28 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි අංක 04/2018 මඟින් දැනුම් දී ඇත. ඒ අනුව එය බස්නාහිර පළාත් සභාවට මෙලෙස අනුගත කර ගෙන ඇත.

I. පත්වීම් දින සිට අවුරුදු 05ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය සමත් නොමැති නිලධාරීන්ගේ පත්වීම් දින සිට අවුරුදු 05ක් පසුව වැටුප් වර්ධකය නතර කිරීම.

II. අනුයාත විභාග අවස්ථා 10 ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ පසු එම නිලධාරීන්ට නතර කරන ලද වැටුප් වර්ධක ඇතුළුව වැටුප් වර්ධක ලබාදීම.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

<u>*පිටපත*</u> : 01. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.